සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reseved

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
# Sabaragamuwa Provincial Department of Education

**දෙවන වාර පරීක්ෂණය - 2018 ජූලි** | **11 ශ්‍රේණිය**
**இரெண்டாம் தவணைப் பரீட்சை 2018 ஆவளி** | **தரம் - 11**
**Second Term Test – 2018 July** | **Grade - 11**

**කතෝලික ධර්මය - I**
**கத்தோலிக்கத் திருமறை - I**
**Catholic - I**

**පැය එකයි**
**1 மணித்தியாலம**
**1 Hour**

- **වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. ශුද්ධ ලියවිල්ලෙහි සම්මත ග්‍රන්ථ නාමාවලිය යනු
1. රදගුරු මණ්ඩලය විසින් අනුමත කරන ලද පොත්ය
2. දේවානුභාවයෙන් ලියන ලද පොත්ය
3. දෙවන වතිකානු මන්ත්‍රණ සභාව විසින් අනුමත කරන ලද පොත්ය
4. ශ්‍රී ලංකා බයිබල් සමාගම විසින් අනුමත කරන ලද පොත්ය

02. නව ගිවිසුමේ පළමුවෙන් ලියවුණු ශුභාරංචිය වන්නේ
1. ශු. මාර්ක් ශුභාරංචියයි 2. ශු. මතෙව් ශුභාරාංචියයි
3. ශු. ලූක් ශුභාරංචියයි 4. ශු. ජොහාන් ශුභාරංචියයි

03. බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ජුද ජාතියේ සමාජයීය හා ආගමික ප්‍රතිස්ථාපනය පිළිබඳ කරුණු ඇතුලත් පොත් දෙකකි.
1. රූත් හා එස්රා 2. එස්තර් හා එස්රා
3. එස්රා හා නෙහෙමියා 4. තෝබිත් හා ජුඩිත්

04. නව අහස හා නව පොළොව ගැන සඳහන් වන ශු. බයිබලයේ ග්‍රන්ථය වන්නේ,
1. ජෝබ්ගේ පොතය 2. දානියෙල්ගේ පොතය
3. සිරාක් පොතය 4. එළිදරව්ව පොතය

05. පැරණි ගිවිසුම තුළ ප්‍රඥාව සඳහා යෙදෙන හෙබ්‍රෙව් නාමය වනුයේ
1. 'පරුසියාය' 2. 'එක්ලේෂියාය' 3. 'හෙක්මාය' 4. 'ෂාලොව්ය'

06. 'මෙතනට ළං නොවන්න, නුඹ සිටින ස්ථානය ශුද්ධ භූමියකි' යනුවෙන් දෙවියන්වහන්සේ විසින් ප්‍රකාශ කළේ
1. ආබ්‍රහම්තුමාටය 2. ඊසාක් තුමාටය
3. ජාකොබ්තුමායට 4. මොසෙස්තුමාටය

07. ආධ්‍යාත්මික ශුභාරංචිය ලෙස හඳුන්වන්නේ
1. ජොහාන් ශුභාරංචියයි 2. මාක් ශුභාරංචියයි
3. මතෙව් ශුභාරංචියයි 4. ලූක් ශුභාරංචියයි

08. A - ගිනි අඟුරකින් තොල් පවිත්‍ර කරන ලදී

B- ජාතීන් හා රාජ්‍යයන් කෙරෙහි බලය ලබා දුනි

C- 'මෙන්න මම මෙහිය. මා යැව්ව මැනව' යන පිළිතුර දෙන ලදී.

D - කුඩා පොතක් අනුභව කිරීමට දෙන ලදී

ඉහත ප්‍රකාශන වලින් යෙසායා දිවැසිවරයා හා සම්බන්ධ ප්‍රකාශය ඇති පිළිතුර වන්නේ,

1. A හා B 2. A හා C 3. B හා D 4. C හා D

09. පුරාණ ගිවිසුමෙහි ජනවන්දනාවට අදාළ නීති නියෝග පිළිබඳව සඳහන් වන පොත වන්නේ,

1. නික්මයාමය 2. ගණන් කථාවය
3. ලෙවී ව්‍යවස්ථාවය 4. ද්විතීය නීති සංග්‍රහය

10. ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ගේ පාද සේදීම හා උත්තම පූජක යාච්ඤාව සඳහන් එකම සුවිශේෂය වන්නේ

1. ශු. මාර්ක් සුවිශේෂයයි 2. ශු. මතෙව් සුවිශේෂයයි
3. ශු. ලූක් සුවිශේෂයයි 4. ශු. ජොහාන් සුවිශේෂයයි

11. 'ජේසුස් වහන්ස, ඔබ රාජශ්‍රියෙන් වඩිනා කළ මා සිහිකළ මැනව.' යනුවෙන් පැවසුවේ

1. පරිසිවරයෙකි 2. කුරුස ගස පාමුල සිටි හේවායෙකි
3. ගෝලයෙකි 4. ජේසුස්වහන්සේ දෙපස සිටින එක් වරදකරුවෙකි

12. ශුද්ධ මහා ජකොබ් හෙවත් සන්තියාගේ මුනිතුමාගේ හිස ගසා දමන ලද්දේ,

1. පිලාත් ආණ්ඩුකාරයාය 2. හොරෝද් (අග්‍රිපාය 1) ය
3. හෙරෝද් ඇන්ටිපස්ය 4. ඩොමිෂියන් අධිරාජ්‍යයාය

13. දෙවන මැවීමේ කථාවෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණයකි

1. ස්ත්‍රිය පුරුෂයාගේ ඉල ඇටයෙන් මැවීම 2. දෙවියන්වහන්සේ විසින් මිනිසා මැවීම
3. මැවීම සඳහා දින හතක් ගතවීම 4. දෙවියන්වහන්සේ ස්වරූපයට මිනිසා මවා තිබීම

14. මුල් කිතුනු සභාවේ 'සහනාධාර බෙදීම' සඳහා පත් කරනු ලැබුවේ

1. ගෝලයන්ය 2. ශ්‍රාවකයන්ය
3. උපස්ථායකයන්ය 4. සභාමූලිකයන්ය

15. ජේසුස් වහන්සේ මුහුණ දුන් පළමු පරීක්ෂාවේදී 'මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේය' යන පිළිතුරෙන් ඔබට ලැබෙන මඟ පෙන්වීම වන්නේ

1. දේව වචනයෙන් පෝෂණය විය යුතු බව යි
2. යක්ෂයා පරාජය කිරීමට දේව වචනය අවශ්‍ය බව යි
3. දේව රාජ්‍යය වෙනුවෙන් ජීවිතය වුවද පූජා කළ යුතු බව යි
4. ජේසුස් වහන්සේ දේව වචනය හොඳින් දැන සිටි බව යි

16. ධර්මදූත සේවයේ යෙදෙන විට පසුම්බියක් හෝ මල්ලක් හෝ පාවහන් හෝ රැගෙන නොයන ලෙසට ශ්‍රාවකයන්ට උපදෙස් දුන්නේ,

1. දේව ප්‍රශංසාව ලැබීමටය 2. දිව්‍ය සංරක්ෂණය අත්දැකීමටය
3. සොරසතුරන්ගෙන් ආරක්ෂා වීමටය 4. ආත්මීක සුවය ලැබීමට යි.

17. දිවැසි කාර්ය තුළ යුක්තිය හා සාධාරණත්වය පිළිබඳව එඩිතරව කතා කරන අයට අද පවා මරණය හිමිවන බව පෙන්වීමට දිය හැකි උදාහරණයකි.
   1. ගරු ගොන්සාල්වෙස් පියතුමා
   2. අති උතුම් තෝමස් කුරේ කාර්දිනල් තුමා
   3. අති උතුම් ප්‍රැන්ක් මාකස් රදගුරු හිමිපාණෝ
   4. ගරු මයිකල් රුද්‍රිගු පියතුමා

18. ස්නාවක ජොහාන්තුමාගේ දේශනයේ අරමුණ වූයේ ජනතාව
   1. සිත් හැරීමකට යොමුකිරිමය
   2. යුක්තිගරුක පුද්ගලයින් කිරීමටය
   3. කිතු දහමේ ආරම්භකයන් බවට පත් කිරීමය
   4. ධර්මදූත සේවයේ යෙදවීමය

19. පාවුලු තුමාගේ පළමු චාරිකාවේදී එතුමා සමග සම්බන්ධ වූයේ
   1. පේදුරුතුමා හා බර්ණබාස්තුමාය
   2. පේදුරුතුමා හා ජොහාන්තුමාය
   3. ජොහාන්මාක්තුමා හා ඇන්ඩෘතුමාය
   4. බර්ණබාස්තුමා හා ජොහාන්මක්තුමාය

20. දෙවියන්වහන්සේ දැකීමේ භාග්‍යය අයිති කර ගන්නේ
   1. සාමය ඇති කරන්නන්ය
   2. නිහතමානී ගුණ ඇත්තන්ය
   3. නිර්මල සිත් ඇත්තන්ය
   4. යුත්තිය උදෙසා පීඩා විඳින්නන්ය

21. සියලු යාග පූජා අතරින් අත්‍යන්තවූද, අපරිමිත වූද, සදාතනිකවූද, අමිල යාගය වන්නේ,
   1. පාප පූජාවයි
   2. කල්වාරි යාගයයි
   3. වන්දි ගෙවීමේ පූජාවයි
   4. දවන පූජාවයි

22. ‘මරිතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව’ යන සංවිධානය ආරම්භ කළේ
   1. ශුද්ධ වූ තෙරේසා මුනිතුමියයි
   2. ශු. 23 වන ජුවාම් මුනිතුමායි
   3. ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමාය
   4. ශු. මැක්සිමිලියන් කොල්බේ මුනිතුමාය

23. ජාතීන්ගේ විනිශ්චය දිනයේදී ක්‍රිස්තුස්වහන්සේ යොදාගන්නා මිනුම් දණ්ඩ වන්නේ
   1. යාච්ඤා ජීවිතය හා උපවාසයයි
   2. ධර්මදූත සේවය හා පරිත්‍යාගයයි
   3. ශාරීරික හා ආත්මීක පුන්‍ය ක්‍රියායි
   4. සාංඝීක ජීවිතය හා දැහැමිකමයි

24. ජේසුස්වහන්සේ දේවරාජ්‍යයේ වටිනකම් පිළිබඳව ඉගැන්වූ උපමා කථාවකි
   1. අබ ඇටය හා මුහුන්
   2. නැතිවූ බැටලුවා
   3. පරිසිවරයා හා අයකැමියා
   4. මහ රෑ පැමිණි මිත්‍රයා

25. එක් වරක් පමණක් ලැබිය හැකි ප්‍රසාද නිධාන අඩංගු නිවැරදි පිළිතුර වන්නේ,
   1. ප්‍රසාදස්නාපනය, දිව්‍ය සත්ප්‍රසාදය, පූජකවරය
   2. ප්‍රසාදස්නාපනය, පූජකවරය, රෝගීන්ගේ ආලේපය
   3. අභිවෘද්ධි ආලේපය, පූජකවරය, දිව්‍යසත්ප්‍රසාදය
   4. ප්‍රසාදස්නාපනය, අභිවෘද්ධි ආලේපය, පූජකවරය

26. ශුද්ධාත්ම වරමින් පූර්ණව පරිණත කිතුනුවකු බවට අපව පත්කරන ප්‍රසාද නිධානය.
   1. ප්‍රසාද ස්නාපනයයි
   2. අභිවෘද්ධි ආලේපයයි
   3. දිව්‍යසත්ප්‍රසාදයයි
   4. පූරකවරයයි

27. ජේසුස්වහන්සේගේ ප්‍රසිද්ධ ජීවතය ආරම්භ වූයේ
   1. පරීක්ෂාවන්ට මුහුණු දීමෙන්ය
   2. සබත්දින ධර්මශාලාවේ දේශනයෙන්ය
   3. ජොහාන්ගේ බෞතිස්මය ලැබීමෙන්ය
   4. කානා නුවර වතුර මිදියුෂට හැරවීමෙන්ය

28. දේව රාජ්‍යය උදාවූ බව ජේසුස්වහන්සේ සනාථ කළේ තම
   1. දේශනා තුළිනි
   2. ඉගැන්වීම් තුළිනි
   3. උපමා කථා තුළිනි
   4. ප්‍රාතිහාර්ය තුළිනි

29. අපෝස්තුච්වරුන්ට පවරන ලද ධර්මදූත සේවාව නොකඩවා ඉදිරියට ගෙනයනු ලබන ප්‍රසාද නිධානය වන්නේ
1. ප්‍රසාදස්නපනයයි
2. දිව්‍ය සත්ප්‍රසාදයයි
3. පූජකවරයයි
4. අභිවෘද්ධි අලේපයයි

30. එකිනෙකාට දානය කර ගනු ලබන ප්‍රසාද නිධානය වන්නේ,
1. ආශිර්වාදකාර බන්ධනයයි
2. ප්‍රසාදස්නපනයයි
3. සමගි සන්ධානයයි
4. දිව්‍ය සත්ප්‍රසාදයයි

31. ගුරුවරුන්ට, වැඩිහිටියන්ට, අකීකරුවීම හා සිත් රිදවීමෙන් කඩ කරනු ලබන දේව පනත වන්නේ,
1. පස්වන පනතයි
2. හතරවන පනතයි
3. හත්වන පනතයි
4. අටවන පනතයි

32. ක්‍රිස්තුස් වහන්සේ රාජතේජසින් ජෙරුසලමට ඇතුල්වීම සිහිපත් කරනු ලබන්නේ,
1. ගොබ් ඉරුදිනය
2. මහබ්‍රහස්පතින්දාය
3. මහ සිකුරාදාය
4. පාස්කුඉරිදාය

33. ජේසුස් වහන්සේව නොහඳුනන බව තෙවරක් ප්‍රකාශ කළේ,
1. ජාකොබ්තුමාය
2. පාවුළුතුමාය
3. ජේදුරුතුමාය
4. තෝමස්තුමාය

34. ක්‍රිස්තුස්වහන්සේ අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාවේදී තම ශ්‍රාවකයන් පිරිවරාගෙන පියාණන්වහන්සේට කළ යැදුම වන්නේ,
1. ස්වාමිවාක් ආරාධනාවය
2. උත්තම පූජක යාච්ඤාවය
3. යාම යැදුමය
4. මල් උයනේ යාච්ඤාවය

35. A පුද්ගලයින් කොන් කිරීම
B වැඩිහිටියන් නොසැලකීම
C බෝවන රෝග පැතිරවීම
D අසභ්‍ය වචන භාවිතය
මේවායින් පස්වන පනතට විරුද්ධ පාපයන් වන්නේ
1. A,B
2. B,D
3. C,D
4. A,C

36. දෙවියන්වහන්සේගේ නාමයට මෙන්ම අන් අයගේ නාමයන්ටද ගරු කළ යුතු බව පෙන්වා දෙන දේව පනත වන්නේ,
1. පළමුවන පනතය
2. දෙවන පනතය
3. තුන්වන පනතය
4. හතරවන පනතය

37. පැවිදිවෙද භාර දෙන නිවැරදිව ඇති පිළිතුර වන්නේ,
1. ව්‍රතශුද්ධිය, කීකරුබව, දිළිඳුකම
2. යාච්ඤාව, භාවනාව, පරිත්‍යාගය
3. කීකරුකම, දිළිඳුකම, යාච්ඤාව
4. ව්‍රතශුද්ධිය, දිළිඳුකම, භාවනාව

38. 'යමෙක් වතුරෙන්ද, ආත්මයාණන්ගෙන්ද, නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකිය' මෙය ජේසුස්වහන්සේ විසින් ප්‍රකාශ කළේ,
1. ජොහාන්ටය
2. පාවුළුතුමාටය
3. නිකදේමුස්ටය
4. මතෙව්ටය

39. ස්වදේශික පැවැදි නිකායක් වන්නේ,
1. ශුද්ධ වූ පවුලේ නිකාය
2. සිරිකුරුස නිකාය
3. දයාවේ සොයුරියන්
4. සුරදූතික කන්‍යා සොයුරියන්

40. 2012 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ රදගුරු පදවි සංඛ්‍යාව වන්නේ,
1. දොළහකි
2. එකොළහකි
3. දහයකි
4. නවයකි